# ග්‍රාමීය සංස්කෘතිය කෙරෙහි සංචාරක කර්මාන්තයේ බලපෑම පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක් (හබරණ ප්‍රදේශය ඇසුරෙන්)

ආර්.ඒ.ඩී.ඩී. රණසිංහ

සමාජය විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
dushmantharanasinghe31@gmail.com

**මුඛ්‍ය පද** - සංචාරක ක්ෂේත්‍රය, සංචරන ක්‍රියාවලිය, සමාජීය සහ ආර්ථික තත්ත්වය, හබරණ ප්‍රදේශය.

## හැඳින්වීම

සමාජයන් තුළ විවිධ අරමුණ සපුරා ගැනීමේ අපේක්ෂාවෙන් දේශයකින් දේශකයට, ප්‍රදේශයකින් ප්‍රදේශයකට පුද්ගලයන් සංචරණය වීම මානව ඉතිහාසය පුරාවට දැකගත හැකි සමාජ සංසිද්ධියකි. සංචරණයේ වර්ධනීය තත්ත්වයක් නිර්මාණය වූයේ 1760 දී දැඩි සමාජ බලපෑමක් සිදු කළ කාර්මික විප්ලවයෙන් පසුවය. "යම් රටකට, නගරයකට හෝ ප්‍රදේශයකට අන්තර් හා බාහිර වශයෙන් විදේශිකයන්ගේ ප්‍රවේශ වීම්, නැවතී සිටීම් සහ ක්‍රියාකාරිත්වය සමඟ සෘජුව සම්බන්ධ වන ආර්ථික පසුබිමක් සහිත සියලුම මෙහෙයවීම් සංචරණය වේ" (Hermann Von Schullard, 1910). සංචරණයේ වැදගත් ලක්ෂණය නම් සංවර්ධිත රටවලින් ඌන සංවර්ධිත රටවලට සිදුකරන සංචරණ ක්‍රියාවලියයි. විදේශකයින් බොහොමයක් පිරිස් සිය රසවින්දනයට, අධ්‍යාපනික අවශ්‍යතා මත, මිත්‍ර සම්බන්ධතා මත, ව්‍යාපාරික අවශ්‍යතා වැනි විවිධ හේතුන් මත අනිකුත් රටවල් වර්තමානය තුළ සංචාරය කිරීමට පෙලඹේ. නමුත් සංචරණ ක්‍රියාවලිය හේතුවෙන් ඌන සංවර්ධිත රටවල ජනතාවට සමාජීය, ආර්ථික සහ සංස්කෘතික වශයෙන් ධනාත්මක මෙන්ම සෘණාත්මක බලපෑම් රැසක් සිදුව ඇත (Ranasinghe, 2014). විශේෂයෙන් සංචාරක කර්මාන්තය නාගරික සමාජ කේන්ද්‍රීයව වෙරළ තීරය අවට ප්‍රදේශයන් සඳහා ඉහළ ආකර්ෂණයක් දැකිය හැකිවුවත්, නූතනය වන විට අර්ධ ග්‍රාමීය සහ ග්‍රාමීය සමාජවල පාරිසරික සාධක කෙරෙහි ඉහළ ඉල්ලුමක් හා සංචාරකයින්ගේ පැමිණීමක් දැකගත හැකිය. සංක්‍රමණය මුල් කරගෙන සමාජීය, ආර්ථික, සංස්කෘතික, දේශපාලනික පැතිකඩවල ධනාත්මක හා සෘණාත්මක වෙනස්කම් මූලාශ්‍ර මගින් සනාථ කර ඇතත්, අර්ධ ග්‍රාමීය සහ ග්‍රාමීය ප්‍රජාවගේ වෙනස්කම් ඉලක්ක කරගෙන පර්යේෂණයන් සිදුවීමේ අඩුවක් දැකිය හැකිය. එම නිසා වර්තමාන පර්යේෂණ අර්ධ ග්‍රාමීය පැතිකඩ නිරූපනය වන හබරණ ප්‍රදේශයේ කැකිරාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තුලානය/පලුගස්වැව ග්‍රාම නිලධාරි වසමට අයත් හබරණ ප්‍රදේශය තුළ ජනතාවගේ සමාජීය, ආර්ථික හා සංස්කෘතික තත්ත්වයන්ට සංචාරක ක්ෂේත්‍රයේ වර්ධනය සිදු කරන බලපෑම හා එමගින් ග්‍රාමීය ජනජිවිතයේ ඇතිව තිබෙන වෙනස්කම් මොනවාද යන්න පර්යේෂණ ගැටලුව ලෙස යොදා ගෙන මෙම පර්යේෂණය සිදු විය. කුටුම්භයන්ගේ පරිභෝජන රටාව අධ්‍යයනය කිරීම සහ අධ්‍යාපනික තත්ත්වය හඳුනා ගැනීම, ආර්ථික බලපෑම හේතුවෙන් සෘජු සහ වක්‍ර රැකියා සංඛ්‍යාව, ස්වභාවය, ආදයම සහ ඔවුන්ගේ ආදායම් ව්‍යාප්තියේ වෙනස්වීම් අධ්‍යයනය කිරීම මෙන්ම සංස්කෘතික වෙනස්වීම් අධ්‍යයනය කිරීම පර්යේෂණයේ අරමුණු වේ.

## ක්‍රමවේදය

පර්යේෂණ ක්ෂේත්‍රයට අදාලව කුටුම්බ 60 ක් ද, අලෙවිසැල් හිමියන් 30 සහ සංචාරක හෝටල් කළමනාකරුවන් 10ක් පර්යේෂණයේ නියැදිය ලෙසින් ගෙන අහඹු නියැදීමේ ක්‍රමවේදය යටතේ ප්‍රශ්නාවලි සහ සම්මුඛ සාකච්ඡා මගින් දත්ත ලබා ගන්නා ලදි. තවද ප්‍රාථමික හා ද්විතියික මූලාශ්‍ර භාවිත කරමින් ප්‍රමාණාත්මක සහ ගුණාත්මක විශ්ලේෂණයක් ලෙසින් මිශ්‍ර ක්‍රමවේදය භාවිතයට ගෙන පර්යේෂණයට ආදල දත්ත විශ්ලේෂණය කිරීම සිදු විය.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

විදේශීය සංචාරකයන්ගේ ඉහළ අවධානයක් දිනාගත් රටක් ලෙස ශ්‍රී ලංකාව හැඳින්විය හැක. එහි දී සංචාරකයන් බහුලව ආකර්ශනය වන ප්‍රදේශයක් ලෙස හබරණ නගරය ද ප්‍රසිද්ධය. එම ප්‍රදේශය තුළ සිදු කළ පර්යේෂණ නියැඳියෙන් 60% සංචාරක ක්ෂේත්‍රය තුළ රැකියාවල නිරත වේ. නියැදියෙන් 20% ක් රාජ්‍ය හෝ පෞද්ගලික බැංකු ණය ගැතියන් වේ. නියැදියෙන් 3% දරුවන් සිය පාසල් ගමන අතහැර ඇත. නියැදියෙන් 10% තරුණ ප්‍රජාව මත් ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වී ඇත. නියැදියට අනුව පර්යේෂණ සොයා ගැනීම් ලෙස හබරණ අර්ධ නාගරික ප්‍රදේශයේ ජීවත්වන ජනතාවගේ සංචාරක ක්ෂේත්‍රය හේතුවෙන් සමාජීය, ආර්ථික සහ සංස්කෘතික වශයෙන් සෘණාත්මක බලපෑම්වලට ගොදුරු වී ඇති බව සහ ආර්ථික තත්ත්වයට සාපේක්ෂව සමාජීය තත්ත්වය ඉතා දුර්වල ස්ථානයකට පත්ව ඇති බව ද නිගමනය විය. මීට අමතරව සමාජීය බලපෑම් ලෙස කුටුම්භය ණය ලබා ගැනීම සමඟ තවත් පහළ මට්ටමකට පත්ව ඇති අතර කුඩුම්භයන් තුළ කාන්තා හා ළමා හිංසනය ද ඉහළ යමින් පවතින බව දත්ත විශ්ලේෂණය හරහා නිගමනය විය. මත්ද්‍රව්‍යවල තවත් ගොදුරක් ලෙස පාසල් ළමුන් සහ තරුණ කොටස් යොමුවීමේ සම්භාවිතාව ඉහළ මට්ටමකින් පවතින බව අනාවරණය විය. වයස අවුරුදු 10 සිට ඉහළ වයස් මට්ටම්වල දරුවන් මෙම මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වි ඇත. විශේෂයෙන් ගංජා, අයිස් වැනි මත්ද්‍රව්‍ය මෙම ප්‍රදේශයන් තුළ වැඩි වශයෙන් සංසරණය වේ. ආර්ථික බලපෑම් ලෙස ආදයම් තත්ත්වය රටේ පවතින ආර්ථික උද්ධමන තත්ත්වය හමුවේ දුර්වල මට්ටමක පවතින අතර, මත්ද්‍රව්‍ය සහ සූදුව හේතුවෙන් කුටුම්බය තුළ දවසේ ආහාර පරිභෝජනය පාවා සීමා කිරීමට සිදුව ඇත. ශ්‍රී ලංකාවේ සංස්කෘතියට ආවේණික වූ ඇතැම් චර්යයාවන් වෙනස්ව ඇති අතර විශේෂයෙන් අපගාමී හැසිරීම් සහ අපරාධ වැඩිවීම හේතුව මත මෙලෙස සංස්කෘතිකාංගයන්වල වෙනස්කම් ඇතිව තිබේ. ඒ අනුව අඩු වයස් විවාහයන්, විවාහට පෙර එකට වාසය කිරීම, සමලිංගික ක්‍රියාකාරකම්, විදේශීය සූදු ක්‍රීඩාවන් සහ ප්‍රකට ලෙස ශරීර සම්බාහන මධ්‍යස්ථාන ව්‍යාජතව පැවතුන ද නිලීනව ගණිකා වෘත්තීන් ක්‍රියාත්මක වීම ද නිරික්ෂණය විය. සමාජ සාරධර්ම සහ අගනාකම් නොසලකා හැරීම හේතුවෙන් ග්‍රාමීය සමාජයේ සංස්ථාපිත වූ සරල ගති පැවතුම් සංකීර්ණ වී කුටුම්භ සම්බන්ධතා විතැන් වී තිබේ. එමෙන්ම පාරම්පරික සංස්කෘතිකාංගයන් අවකලනය වී ඇති අතර වාග් විලාසය සහ ඇඳුම් විලාසිතා බටහිරකරණයට සමානව අනුකලනය වී ඇති බව පැහැදිලි විය. මේ අනුව සංචාරක ක්ෂේත්‍රයේ වර්ධනය හේතුවෙන් හබරණ නාගරික ප්‍රදේශයන් හි තරුණ ප්‍රජාවන් හට රැකියාවන් උත්පාදනය, විදේශ භාෂාවන් හි දියුණු ආදිය ද ඇතුළුව සමාජීය සහ ආර්ථික තත්ත්වය යම් වර්ධනයක් පිටතින් නිරීක්ෂණය වුවද, එම ප්‍රදේශයන්හි ජනතාවගේ සමාජීය, ආර්ථික සහ සංස්කෘතික තත්ත්වය දුර්වල මට්ටමක පවතින බව පර්යේෂණයේ නිගමනය විය. එම ප්‍රදේශයන්හි ජනතාවට සංචාරක ක්ෂේත්‍රය හරහා මුදල් ඉපැයීම පිළිබඳ සාක්ෂරතාවය ලබා දිමේ වැඩසටහන් පැවැත්වීම සහ දරුවන්ව අධ්‍යාපනයට නැඹුරු කර වීම සඳහා දෙමාපියන්ව දැනුවත් කිරිම, ප්‍රදේශයේ පොලිසිය මැදිහත්ව මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධ නිති රීති දැඩි කිරීමට කටයුතු කිරීම යෝජනා කළ හැක.

මෙ මඟින් ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය හේතුවෙන් ග්‍රාමීය සංස්කෘතියට සිදුව ඇති ධනාත්මක බලපෑමට සාපේක්ෂව සෘණාත්මක බලපෑම වැඩි බව අනාවරණය විය. සිදුව ඇති පර්යේෂණ තුළ සංචාරක කර්මාන්තය හේතුවෙන් ග්‍රාමීය සංස්කෘතියට වඩා නාගරික සංස්කෘතියට අවධානය දී ඇත (Ranasinghe, 2014). එහි දී ධනාත්මක බලපෑම් පිළිබඳ වැඩි නැඹුරුවක් දක්වා ඇත. නමුත් නව පර්යේෂණ දැනුම යටතේ නගරබඳ ප්‍රදේශවලට සාපේක්ෂව සාක්ෂරතාවයෙන් අඩු අර්ධ ග්‍රාමීය ප්‍රදේශයන් තුළ සංස්කෘතියට දැඩි සෘණ බලපෑමක් සංචාරක කර්මාන්ත හරහා සිදුවන බව නිගමනය විය.

**ආශ්‍රිත මූලාශ්‍රය**

Bandara, H.M, (2001/2003), ***Tourism Development Planning in Developing Countries***, A critique, Colombo: Stamfordlake.

Maccannell, D. (1976), ***The Tourist: A New Theory of the Leisure Class***, New York: Choken.

Peter, J. F. (1993), ***Heritage and Tourism in Global Village***, London: Routledge.

Ranasinghe, R.A.W. (2014), ***Social Impact of Tourism: A Case study of Hikkaduwa Divisional Secretariat Division***, University of Peradeniya: Faculty of Art.